(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 123.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2011 සැප්තැම්බර් මස 20 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0454/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා 2010 ජුනි 8 සිට 10 දක්වා සිදු කළ ඉන්දීය සංචාරයේදී දමිළ ජාතිකයින් සඳහා නිවාස 50,000 ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකාවට රුපියල් බිලියන විසි හතරක් ප්‍රදානය කිරීමට ඉන්දීය රජය එකඟ වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අරමුදල් භාවිතා කරමින් අද වන විට ඉදිකර ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ඉදිකර ඇති ස්ථාන සහ එම නිවාස ලබාදුන් පුද්ගලයන්ගේ නම් කවරේද;

(iii) නිවාස ඉදිකිරීමට පෙර ඉන්දියාව විසින් ලබා දුන් මුදල් ප්‍රමාණය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) නව නිවාස ලබා දීම සඳහා අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයන් තෝරාගැනීමේදී භාවිතා කළ නිර්ණායක කවරේද;

(ii) ඔවුන් දමිළ ජාතිකයන්ද; මුස්ලිම් ජාතිකයන්ද; සිංහල ජාතිකයන්ද;

(iii) අවතැන් වූ සියලු පුද්ගලයන් පදිංචි කරවීම සඳහා නව නිවාස කොපමණ සංඛ්‍යාවක් ඉදිකිරීම අවශ්‍ය වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0862/'10

2.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පොත් ප්‍රකාශන ආධාර ව්‍යාපෘතිය නොහොත් ලේඛකාධාර ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය කවරේද;

(ii) ආරම්භයේ සිට අද දක්වා එම ව්‍යාපෘතිය සඳහා එක් එක් වර්ෂය සඳහා රජයෙන් වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය යටතේ ආධාර ලබාගත් ලේඛකයින්ගේ සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්තමානයේ දී එම ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය කවරේද;

(ii) ලේඛකයින්ට මහඟු අත්වැලක් වූ මෙම ව්‍යාපෘතිය වරින් වර අක්‍රියවීම්වලට ලක්වීම වළක්වා ගැනීම සඳහා ස්ථිර පදනමක් සකස් කිරීමට පියවර ගන්නේද;

(iii) එසේ නම්, ඒ කවර දිනයකදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0880/'10

3.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (6)

(අ) 2007, 2008 සහ 2009 වර්ෂ සඳහා ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ සම්පූර්ණ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද;

(ආ) එම එක් එක් වර්ෂයේදී,

(i) දේශන ගාස්තු වශයෙන් අයකර ගන්නා ලද මුදල;

(ii) නීති විද්‍යාල ප්‍රවේශ විභාගයේ අයදුම්පත් ගාස්තු වශයෙන් අයකර ගත් මුදල;

(iii) එම විභාගයේ විභාග ගාස්තු වශයෙන් අයකර ගත් මුදල;

(iv) වෙනත් ක්‍රම මගින් ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ලැබුණු ආදායම;

(v) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ වියදම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ මූල්‍ය කළමනාකරණය විධිමත් කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) 2009 වර්ෂය සඳහා අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාවේ දක්වා ඇති පරිදි දේශන ගාස්තු වැඩිකිරීමකින් තොරව ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ කටයුතු පවත්වාගෙන යෑමට නොහැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1152/'11

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රෙදිපිළි පංගු මණ්ඩලය වසා දැමීම සඳහා කටයුතු කරමින් පවතින්නේද;

(ii) එසේ නම්, එම ආයතනය සතු වත්කම් වෙනත් ආයතනයකට පැවරීමට හෝ විකුණා දැමීමට සැලසුම් කර තිබේද;

(iii) එම මණ්ඩලය සතුව දැනට පවත්නා මුළු වත්කම්වල ප්‍රමාණය කොපමණද;

(iv) දැනට එම ආයතනයේ සේවය කරනු ලබන ස්ථිර හා අනියම් සේවක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රෙදිපිළි පංගු මණ්ඩලය වසා දැමුවහොත් එහි සේවය කරන විශාල පිරිසක් දැඩි ආර්ථික අපහසුතාවන්ට මුහුණ දෙන බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එම සේවකයින්ගේ රැකියාවල සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1165/'11

5\.

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) වර්ෂ 1980 සිට 2011 පෙබරවාරි මාසය දක්වා රජයේ සේවකයින් සංඛ්‍යාව වැඩිවී ඇති ආකාරය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම කාල සීමාව තුළ ජීවන වියදම් දර්ශකය වැඩි වී ඇති ආකාරය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහළ යන ජීවන වියදමට සාපේක්ෂව රාජ්‍ය සේවකයින්ගේ වැටුප් වැඩිවී නොමැති බව එතුමා පිළිගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1265/'11

6\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් පාරිභෝගික සුබසාධන අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0645/'10

7\.

ගරු රවී කරුණානායක මහතා,— කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පෞද්ගලික අංශයේ අවම වැටුප් වැඩිකරනු ලබන දිනය කවරේද;

(ii) පෞද්ගලික අංශයේ විවිධ සේවක ගණයන් සඳහා වැඩිකිරීමට නියමිත වැටුප් ප්‍රමාණයන් ශ්‍රී ලංකා රුපියල්වලින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉකුත් වර්ෂ 10 ක කාලසීමාව තුළ පෞද්ගලික අංශ සේවකයන්ගේ වැටුප් වැඩිකරනු ලැබූ අවසන් අවස්ථාවන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය අංශයේ වැටුප් වැඩිකරනු ලබන දිනය කවරේද;

(ii) වැඩිකිරීමට නියමිත වැටුප් ප්‍රමාණය කොපමණද;

(iii) රාජ්‍ය සේවයේ විවිධ සේවක ගණයන් සඳහා වන අවම විශ්‍රාම වැටුප් සහිත වැටුප් ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1153/'11

8\.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුරාවස්තු ආඥාපනත යටතේ ආරක්ෂා කළ යුතු ජාතික වැදගත් සිද්ධස්ථානයන් ලෙස මේ දක්වා ශ්‍රී ලංකාව තුළ නිල වශයෙන් ප්‍රකාශයට පත් කොට ඇති බෞද්ධ ආගමික සිද්ධස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථානවල නම්, ලිපිනයන් හා එම එක් එක් ස්ථානය ප්‍රකාශයට පත් කොට ගැසට් කළ දිනය හා ගැසට් අංකය දිස්ත්‍රික් මට්ටමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ වන විට එම බෞද්ධ සිද්ධස්ථාන සංරක්ෂණය කිරීම සඳහා ක්‍රමවේදයක් සකසා තිබේද;

(iv) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1179/'11

9\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයාගේ සම්පූර්ණ නම හා වයස කවරේද;

(ii) ඔහු පත්කළ බලධාරියා කවුරුන්ද;

(iii) එම සභාපතිවරයා මීට පෙර සේවය කළ ස්ථානය හා දැරූ තනතුර කවරේද;

(iv) ඔහුගේ වෘත්තීය පළපුරුද්ද කවරේද;

(v) ඔහුගේ මාසික වැටුප හා ලැබෙන වෙනත් දීමනා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1266/'11

10\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1608/'11

11\.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ, කෙසෙල්වත්ත, දිග්ගල තොටුපල සහ කොළඹ දිස්ත්‍රික්කයේ පිළියන්දල, තුඩුව අතර යෙදවීමට නියමිත පාලම් පාරුව බණ්ඩාරගම, හිරණ තොටුපලේ සිට දිග්ගල තොටුපලට රැගෙන එන ලද දිනය කවරේද;

(ii) එකී පාලම් පාරුව මෙතෙක් භාවිතය සඳහා යෙදවීමට නොහැකිවීමට හේතු කවරේද;

(iii) එම පාලම් පාරුව ගමනාගමනය සඳහා භාවිතා කිරීම ආරම්භ කිරීමට යෝජිත දිනය කවරේද;

(iv) පාලම් පාරුව භාවිතය ආරම්භ කිරීම සඳහා ඉලක්කගත දිනයක් නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1154/'11

12\.

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙන්කන්දෙලිය ග්‍රාමයේදී ඌරව ගඟ හරස් කොට වේල්ලක් තනා හම්බන්තොට දිස්ත්‍රික්කයට ජලය සැපයීමේ සැලසුමක් පවතින බව එතුමා දන්නේද?

(ii) එසේ නම්, එම ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

(iii) ඒ සඳහා වැය කිරීමට ඇස්තමේන්තු ගත මුදල කොපමණද;

(iv) එම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ගන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විට ඉහත සඳහන් ස්ථානයට අමතරව ඌරව ගඟේ පහළ කොටසේ අම්පනාගල ග්‍රාමයේදී ද වේල්ලක් ඉදිකිරීම සඳහා මැනුම් කටයුතු සිදු කරමින් පවතින බවත්;

(ii) ඒ අනුව එම ව්‍යාපෘතියට අදාළ ස්ථිර ස්ථානය පිළිබඳ ප්‍රදේශයේ ජනතාව තුළ පවතින සැකය නිසා වර්ෂ 10ක පමණ කාලයක සිට ස්ථිර භෝග වගාවන් සහ නිවාස ඉදි කිරීමේ කටයුතු නතරවී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) මේ වන විට එම ව්‍යාපෘතිය ආරම්භ කරන ස්ථිර ස්ථානය තීරණය කර තිබේද;

(ii) එසේ නම්, එම ස්ථානය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1180/'11

13.

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ දී විශේෂ ව්‍යාපෘති යටතේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත්, තෝරාගත් වතුවල ආරම්භ කළ විශේෂ ව්‍යාපෘති කවරේද;

(ii) එම එක් එක් ව්‍යාපෘතිය සඳහා වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් ව්‍යාපෘතිය යටතේ අද වනවිට උපයා ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම එක් එක් ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1188/'11

14.

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) සමස්ත තිරිඟු පිටි පරිභෝජනය සහ ඒක පුද්ගල තිරිඟු පිටි පරිභෝජනය කොපමණද;

(ii) දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලැබූ තිරිඟු පිටි ප්‍රමාණය කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේදී තිරිඟු පිටි කිලෝග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය කවරේද;

(iv) ආනයනය කරනු ලැබූ තිරිඟු පිටි ප්‍රමාණය කොපමණද;

(v) ආනයනය කරනු ලැබූ තිරිඟු පිටිවල වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ආනයනය කරනු ලබන සහ දේශීයව නිපදවනු ලබන තිරිඟුපිටි කිලෝග්‍රෑම් 1ක් සඳහා පනවා ඇති සියලුම බදු (ඍජු හා වක්‍ර) කවරේද යන්නත් එතුමා වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1267/'11

15.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ග්‍රාමීය කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් ග්‍රාමීය කටයුතු අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා,— නොතාරිස් (සංශෝධන),— නොතාරිස් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

2.

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා,— ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන),— ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 7 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 1),— 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2010 ජූනි 29 දිනැති අංක 1660/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*2.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 2),— 1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනතින් සංශෝධිත, 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2010 මාර්තු 24 දිනැති අංක 1646/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*3.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 3),— 1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනතින් සංශෝධිත, 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2010 මාර්තු 24 දිනැති අංක 1646/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*4.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 4),— 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*5.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 5),— 1991 අංක 20 දරන ආහාර (සංශෝධන) පනතින් සංශෝධිත, 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2009 සැප්තැම්බර් 01 දිනැති අංක 1617/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*6.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 6),— 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදනු ලදුව, 2011 පෙබරවාරි 23 දිනැති අංක 1694/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*7.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තු සේවයේ ස්වාධීන තත්ත්වය ශක්තිමත් කිරීම පිළිබඳ කරුණු සොයා බලා වාර්තා කිරීම පිණිස වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල සහ 2010.10.06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, මෙම කාරක සභාව සාමාජිකයින් හත් (07) දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

*8.

මුදල් ව්‍යාපාර පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*9.

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනි වර කියවීම.

*10.

ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනි වර කියවීම.

*11.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 2011 අංක 17 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතින් අවසන් වරට සංශෝධිත, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 ඇ වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් නිෂ්පාදන බදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2011 ජූනි 01 දිනැති අංක 1708/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.09.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(1) වැනි වගන්තිය යටතේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයා විසින් සෙස් බදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2011 ජූලි 01 දිනැති අංක 1712/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.09.09 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනි වර කියවීම.

*16.

වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*17.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*18.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*19.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*20.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*22.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*23.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.06.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*24.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.09.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*25.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2008,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.12.03 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික හා තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*26.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව 2008,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරි පනතේ 34 වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.06.30 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*27.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*28.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*29.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*30.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

31.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

32.

බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1631/'11

1.

ගරු රාජීව විජේසිංහ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගෘහස්ත ප්‍රචණ්ඩත්වය වැළැක්වීම් පනත යටතේ,

- (i) යම් කිසි ඉල්ලීමක් මත එම ඉල්ලීම පිළිබඳ විමර්ශනය අවසන් වන තෙක් අධිකරණය විසින් අතුරු ආරක්ෂණ නියෝගයක් නිකුත් කළ යුතු බවත්;
- (ii) ඉල්ලීම ඉදිරිපත් කළ දින සිට දින 14ක් ඇතුළත එම ඉල්ලීම පිළිබඳ විමර්ශනයක් පැවැත්වීමට අධිකරණය විසින් නියෝගයක් නිකුත් කළ හැකි බවත්; සහ
- (iii) අතුරු ආරක්ෂණ නියෝගයක් මාස 12 නොඉක්මවන කාල සීමාවක් සඳහා බල පැවැත්වෙන බවත්;

එතුමා දන්නෙහිද ?

(ආ) (i) එම නම් කරන ලද කාල සීමාවට පසු විමර්ශන නොපැවැත්වූ සහ විමර්ශන පැවැත්වූ නඩු කවරේද;

- (ii) මෙම නීතිය ක්‍රියාත්මක කිරීමට නොහැකිවූ මහේස්ත්‍රාත්වරුන්ට මග පෙන්වීම සඳහා යොදා ගන්නා ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග සහ එම නිසා ප්‍රමාදයන්ට ලක්වූ වින්දිතයන්ට ගෙවීමට තිබෙන වන්දි ප්‍රමාණය කවරේද;

(iii) අතුරු නියෝග නොවන නියෝග සඳහා අවසන් දිනයක් තිබීමටත්, අතුරු නියෝග සඳහා එවන් දිනයක් නොතිබීමටත් හේතුව කවරේද;

(iv) එම විෂමතාව නිවැරදි කිරීම සඳහා පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1632/'11

2.

ගරු රාජීව විජේසිංහ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2001 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂයේදී, 1841 අයාල ආඥාපනත යටතේ අත්අඩංගුවට ගත් සහ රක්ෂිත බන්ධනාගාරගත කළ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) රක්ෂිත බන්ධනාගාරගත කොට සිටි අය අතුරින් තවමත් බන්ධනාගාරගතව සිටින හෝ වෙනත් ස්ථානවල රඳවා සිටින සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අයාල ආඥාපනතෙහි සඳහන් වන "නිවැරදි කළ නොහැකි නොදැමුණු පුද්ගලයන්" (Incorrigible Rogues) යන පදයෙහි අර්ථය කවරේද;

(ii) එම පදය භාවිතාකොට ඇත්තේ කවර අරමුණකින්ද?

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අයාල ආඥාපනතට සිදු කරන ලද වෙනස්කම් පිළිබඳව 2004 වසරේදී මානව හිමිකම් කොමිසම ඉදිරියේ නිර්දේශ ඉදිරිපත් කරන ලද බව පිළිබඳව සහ ඒවා භාවිතා කරන ආකාරය එතුමා දන්නෙහිද?

(ඈ) (i) ඉහත සඳහන් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම සඳහා පියවර ගනු ලැබුවේද;

(ii) නොඑසේ නම්, එම ආඥාපනත යටතේ වන ව්‍යවහාරයන් සඳහා වන වෙනස් කිරීම් තහවුරු කිරීමට ගනු ලබන අනෙකුත් ක්‍රියාමාර්ග කවරේද?

යන්න එතුමා සඳහන් කරන්නෙහිද;

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?